# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1979/23 – 2016 අගෝස්තු 09 වැනි අඟහරුවාදා – 2016.08.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/22/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

එම්. ඒ. රණසිංහ මයා, පඬිවත්ත, කුණ්ඩසාලේ, නත්තරම්පොත

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක. 128, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.


1A – G 24008– 27 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

එම්. ඒ. රණසිංහ මයා, පඩිවත්ත, කුණ්ඩසාලේ, නත්තරම්පොත

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ්, එයාර්ලයින් සෙන්ටර්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ –**

ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් හා ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය අතර 1996.11.01 දින සිට 1999.05.31 දින දක්වා කාලයට අදාළව ඇති කර ගන්නා ලද ගිවිසුම ප්‍රකාරව එම සංගමයේ සාමාජිකයන්ට ලබා දුන් වැටුප් වැඩිවීම, අදාළ ආයතනයේ අභ්‍යන්තර ගුවන් සේවා සත්කාරක වශයෙන් සේවය කළ එම්. ඒ. රණසිංහ මහතාට ලබා නොදීම යුක්තිසහගතද? එසේ යුක්ති සහගත නොවේ නම්, ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජුනි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 661

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.